## බ්‍රහස්පතින්දා

පළමුවන කියැවීම		1 මකබ් 2: 15–29

මකබ්වරුන්ගේ පළමු වන පොතෙන් ගත් පාඨයෙකි.

**“අපේ ආදි පියවරුන්ගේ ගිවිසුම අනුගමනය කරන්නෙමු.”**

ආගම ප්‍රතික්ෂේප කරවීමේ නීතිය ක්‍රියාත්මක කළ රාජකීය නිලධාරීහු මොදෙයින් නගරයේ වැසියන් ලවා පූජා ඔප්පු කරවනු පිණිස එහි පැමිණියහ. බොහෝ ඉශ්රායෙල්වරුන් ඔවුන්ගේ වටේට රැස් වූ නමුත්, මතතියස් ද ඔහුගේ පුත්‍රයෝ ද ඈත් වී සිටියහ. එවිට රාජකීය නිලධාරීහු මතතියස් අමතමින්, “ඔබ සම්භාවනීය නායකයෙකි. මේ නගරයේ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි. ඔබට ආධාර දීමට පුත්‍රයෝ සහ සහෝදරයෝ සිටිති. සියලු ජාතීන් ද ජුදා දේශයේ නායකයන් ද ජෙරුසලමෙහි ඉතිරිව සිටින අය ද කර තිබෙන පරිදි ඉදිරියට පා තබා රාජාඥාවට එකඟ වීමට පළමුවා වැනියා වන්න. එවිට ඔබ ද ඔබේ පුත්‍රයන් ද රජතුමාගේ මිතුරන් අතරෙහි ගණන් ගැනෙනු ඇත. ඔබටත් ඔබේ පුත්‍රයන්ටත් රන් රිදී සහ බොහෝ තෑගි බෝග ලැබෙනු ඇතැ”යි කීවෝ ය. මතතියස් ද හඬ නගා එකටෙක කියමින් “රජතුමාගේ ආධිපත්‍යයෙහි වසන සෑම ජාතියක් ම ඔහුගේ ආඥාවලට එකඟ වන පිණිස තම තමන්ගේ ආදි පියවරුන්ගේ ආගම ප්‍රතික්ෂේප කර එතුමන් හට කීකරු වුවත් මාගේ පුත්‍රයෝ ද මාගේ සහෝදරයෝ ද මම ද අපේ ආදි පියවරුන්ගේ ගිවිසුම් අනුගමනය කරන්නෙමු. අපේ ව්‍යවස්ථාවෙන් හා අණපණත්වලින් ඉවතට නොහැරෙන්නෙමු. අපි රජතුමාගේ නීති අනුගමනය නොකරන්නෙමු. කෙලෙසවත් අපේ ආගම ධර්මයෙන් නම් අපි පිට නොයන්නෙමු’ යි කීය.

ඔහු කතා කොට අවසාන වූ විට, සියල්ලන් බලා සිටියදීම රාජ ආඥාව අනුව මොදෙයින්හි පූජාසනය පිට පුද පූජාවන් ඔප්පු කිරීම පිණිස ජුදා ජාතිකයෙක් ඉදිරියට පැමිණියේය. මතතියස් මෙය දුටු විට ඔහු උද්‍යෝගයෙන් ඇවිළිණි. ඇට මිදුළු දක්වා ඔහු සලිත විණි. ඔහු තමාගේ සාධාරණ කෝපයට ඉඩ දෙමින් ඒ මිනිසා පිට කඩා පැන පූජාසනය මත ඔහු මරා දැමීය. එවිට ම ඔහුට පූජාව කිරීමට බල කරමින් සිටි රාජකීය නිලධාරියාත් මරා දමා පූජාසනය ද කඩා බිඳ දැමීය. ව්‍යවස්ථාව පිළිබඳ උද්යෝගයෙන් සලුගේ පුත් සිම්රිට විරුද්ධව පිනේහාස් කළාක් මෙන් ඔහු ක්‍රියා කළේය. ඉන් පසු මතතියස් ගමන් කරමින් මහ හඬින් හඬ නගා “ව්‍යවස්ථාව සඳහා උද්යෝගය ඇති ගිවිසුමට පක්ෂපාත වන සෑම කෙනෙක් ම පිටතට අවුත් මා පසුපස පැමිණෙත්වා”යි කෑ ගැසීය. මෙසේ කියා, තමාගේ ධන සම්පත් සියල්ල ම නගරයේ අත්හැර දමා ඔහු තම පුත්‍රයන් සමඟ කඳුකරයට පලා ගියේය.

එවිට සුචරිතය සහ සාධාරණත්වය ගැන සැලකිලිමත් වූ බොහෝ දෙනෙක් තමන් සමඟ තමන්ගේ පුත්‍රයන් ද භාර්යාවන් ද ගවමහීෂයන් ද රැගෙන පාළුකරයට බැස ගොස් එහි නැවතී සිටියහ.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය

පිළිතුර: සමිඳුන්ට කීකරු වන හැම දෙනම ගැළවීම ලබන්නෝ ය.

ගීය:

සව් බලැති දෙවි සමිඳාණෝ ශ්‍රී මුඛය විවෘත කර
පෙරදිග පටන් අපරදිග දක්වා මුළු ලොවට කතා කරන සේක.
අලංකාරයෙන් අගතැන් පත් සියොන්හි සිට, දෙවිඳාණෝ වැජඹෙන සේක.

"පුද පූජා ඇතිව මා සමග ගිවිසුමක් කළ මාගේ සැදැහැවතුන් මා වෙත රැස් කරන්නැ"යි එතුමාණෝ වදාළ සේක.
දෙවිඳාණන් දැහැමි බව ද දෙවිඳාණන් විනිසකරුන් බව ද අහස් මඬල ලොවට දන්වයි.

දෙවියන්ට තුති දීම නුඹේ යාගය වේවා. සව් බලැති දෙවිඳුන්ට නුඹේ භාර ඉටු කරන්න.
විපත්තියේ දී මට යාච්ඤා කරන්න.
මම නුඹ මුදන්නෙමි. නුඹ මට ගෞරව කරනු ඇත.

සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
"දයාවෙන් මා දෙස බැලුව මැනව.
ඔබේ පණත් මට ඉගැන්නුව මැනව."
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"එතුමාණෝ අපේ දෙවිඳාණෝ ය. අපි එතුමන්ගේ සෙනග ය. එතුමාණන් පෝෂණය කරන බැටළුවෝ ය. එතුමාණන් පවසන දේට සවන් දුන්නොත් යහපත."
ආලේලූයා!

සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 19: 41-44

**"අහෝ! ඔබට ශාන්තිය සලසන දේ ගැන මේ උදාර දිනයේ දී වත් ඔබ දැන සිටියා නම්!"**

ජේසුස් වහන්සේ අග නුවරට ළඟා වී එය දුටු විට නුවර ගැන හඬමින් මෙසේ වදාළ සේක. "අහෝ ඔබට ශාන්තිය සලසන දේ ගැන මේ උදාර දිනයේ දී වත් දැන සිටියා නම්! එහෙත් එසේ නොවීය. එය ඔබේ දෙනෙතින් සැඟ වී ඇත. ඔබේ සතුරන් බලකොටු තනා ඔබ සිසාරා සතර දිගින් ඔබ වටලන දවස් පැමිණෙන්නේය.

ඔව්හු ඔබ ද ඔබ තුළ සිටින දරු කැළ ද පොළොවේ ගසා ගලක් පිට ගලක් තිබෙන්නට ඉඩ නාරින්නෝ ය. මන්ද දෙවියන් වහන්සේ ඔබ ගලවන්නට පැමිණෙන දවස ඔබ නොදත් හෙයිනි."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.